## 7 ශ්‍රේණිය.

## [ප්‍රස්ථාරකරණයේ විශේෂ අවස්ථා(සමග්‍රහ,අවග්‍රහ ,විෂමග්‍රහ).]

- දේශීය ජන සංගීතයේ තාලයේ පදනම තිතයි.
- ඒ සඳහා තාලම්පට වාදනය කරනු ලබයි.



- තාලම්පටෙන් වාදනය කරීමේදී නිකුත් වන ධ්වනි, තිත් හා තෙයි නම් වේ.
- තාලම්පටේ අප්‍රාණික ආඝාතය යනු පියන් පත් දෙක එකිනෙක වැසී යන පරිදි පිටතට හඬ නොවිහිදෙන ලෙස නාද කිරීමයි.
- එය **තිත්** නම් වේ.

<u>තිත්</u>

Λ

- තාලම්පටේ පියන් පත් දෙක හඬ විහිදෙන පරිදි නාද කිරීමේ දී එයින් උපදිනුයේ සප්‍රාණ හඬකි.
- එය **තෙයි** නම් වේ.

<u>තෙයි</u>

/

- ග්‍රහ යනු අල්ලා ගැනීම හෙවත් ග්‍රහණය කිරීමයි එහිදී එයට ආඝාත යන යෙදුමද යෙදේ.
- මේ අනුව ග්‍රහයන් පැවතිය හැකි **ක්‍රම තුනකි.**

    I. සමග්‍රහ
    II. අවග්‍රහ
    III. විෂමග්‍රහ

- **සමග්‍රහ (On The Beat)**

➢ පෙරදිග ප්‍රස්තාර කරණයේ දී ග්‍රහ යනු පිහිටීම යන අර්ථය දෙයි.

➢ ගීතය තාලයක් ග්‍රහනය කර ගන්නා අවස්ථා තුනෙන් සමග්‍රහ ප්‍රධාන වේ.

➢ තාලයත් ගීතයත් එකවර ආරම්භ වීම සමග්‍රහ ලෙස හැඳින් වේ.

උදා-:1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3
පු ං චි | තා S ර | කා S S | S S S

- **අවග්‍රහ (Off Beat)**

➢ ග්‍රහය හෙවත් පිහිටු වීම එකවර නොවී තාලය ප්‍රථමයෙනුත් ගීතය දෙවනුවත් ආරම්භ කිරීම අවග්‍රහ නම් වේ.

උදා-:1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3
+සස ර | ව ස න | තු රු S | S S S

- **විෂමග්‍රහ (Before The Beat)**

➢ ගීතයට පසුව තාලය ආරම්භ වීම විෂමග්‍රහ ලෙස හැඳින් වේ.

උදා-: 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3
දුර | පෙ නෙ න | තැ නි ත | ලා S S | S S S

පැවරුම

1. තාලම්පට වාදානයේ දී නිකුත් වන ධ්වනි දෙක නම් කරන්න.
2. ග්‍රහ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
3. ග්‍රහයන් පැවැත්විය හැකි ක්‍රම තුන නම්කරන්න උදාහරණ දක්වන්න.

සැකසුම -ශ්‍රියා නන්දනී ප්‍රේමරත්න.
ගුරු උපදේශක (සංගීත)
කලාප අධ්‍යාපන කාර්යාලය
බලංගොඩ.